**මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

## 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 20 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව වෙත පවරාගෙන තිබුණු ඉඩම් කැබලි 02ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සභාව සතු ජල යෝජනා ක්‍රම 02ක් සඳහා දරන ලද රු.13,934,815ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඇ) මකුල්ල සතිපොළ භූමියේ මස් හා මාළු වෙළඳ කුටි 04ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.1,551,347ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඈ) මකුල්ල නව බස් නැවතුම්පොළ කඩකාමර බෙදා වෙන් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.644,702ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඉ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් 2012 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට භාරදෙන ලද මකුල්ල ජල ව්‍යාපෘතියේ වියදම හඳුනාගෙන ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඊ) කාර්යාලය සඳහා පරිගණක 02ක් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.201,000ක් ගිණුම්ගතකර නොතිබුණි.

(උ) රු.27,600ක් වටිනා ගෘහස්ථ කසළ බඳුන් තොගයක් ජර්නල් සටහන් මගින් ණයට විකුණුම් ලෙස වාර්තාකර තිබීම නිසා ලැබිය යුතු ගිණුම් හා අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) පෙර වර්ෂවල ප්‍රාග්ධනිතකර තිබුණු ස්ථාවර වත්කම් නොවන රු.40,195ක අයිතම ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමේදී, සමුච්චිත අරමුදලට හරකර තිබීම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල අඩුවී තිබුණි.

(එ) මඩුල්ල බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ගණනයකර තිබුණු රු.529,358ක ප්‍රමාද ගාස්තු ආදායමට නොගෙන සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණය හිමියෝ ලෙස දක්වා තිබුණි. මේ නිසා ගෙවිය යුතු වියදම් එම වටිනාකමින් වැඩියෙන් ද සමුච්චිත අරමුදල එම වටිනාකමින් අඩුවෙන් ද දක්වා තිබුණි.

## 1.3.2 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

**(අ)** <u>ලැබිය යුතු ගිණුම්</u>

(i) වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින රු.378,800ක් වූ හිඟ කඩ කුලී ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) 2015 හා 2016 වර්ෂවලට අදාළ හිඟ ජල ගාස්තු රු.29,024ක් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(iii) 2015 වර්ෂයට අදාළ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.96,030ක් හා 2016 වර්ෂයට අදාළ ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.91,099 ක් සමාලෝචිත වර්ෂය අවසානයවන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**(ආ)** <u>ගෙවිය යුතු ගිණුම්</u>

2015 හා 2016 වර්ෂවල ඉටු කරන ලද කර්මාන්ත 09ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.722,891ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

## 1.3.3 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රය භාවිතාකර නිළධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධ වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.

## 02. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,883,402ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,224,531ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | - රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | 685,965 | 567,996 | 117,969 | 1,200,000 | 1,270,364 | 1,144,689 | 125,675 |
| (ii) | කුලී | 5,332,260 | 5,320,664 | 5,320,664 | - | 5,325,369 | 5,309,433 | 5,309,433 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 517,500 | 761,734 | 761,734 | - | 383,100 | 455,072 | 455,072 | - |
| (iv) | වෙනත් ආදායම් | 11,745,350 | 3,922,532 | 3,922,532 | 1,247,599 | 10,574,500 | 1,148,676 | 1,148,676 | 1,564,293 |
| | එකතුව | **17,595,110** | **10,690,895** | **10,572,926** | **1,365,568** | **17,482,969** | **8,183,545** | **8,057,870** | **1,689,968** |

#### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 10.6ක් වූ අතර, වර්ෂය තුලදී රැස්කළ ආදායම රුපියල් මිලියන 10.5ක් විය. කෙසේ නමුත් වර්ෂය අවසානවන විටත් රුපියල් මිලියන 1.3ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 19කින් අඩුවී තිබුණි.

#### 2.2.3 <u>වෙනත් ආදායම්</u>

(අ) සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය කුලියටදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.109,700ක් වර්ෂය අවසානවන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව සභාව විසින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා අනුව ගාස්තු අයකිරීමට ප්‍රසිද්ධකර තිබුණු නමුත් රු.135,000ක ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) වර්ෂයට අදාළ හිඟ ජල ගාස්තු රු.82,930ක් සමාලෝචිත වර්ෂය අවසානයවන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 256,082ක් හා මුද්දර ගාස්තු රු. 1,178,647ක් විය.

**03.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 23ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) <u>ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය</u>

ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා කසළ බදු අයකර සමාලෝචිත වර්ෂයේ කසළ කළමනාකරණ වියදම පියවාගෙන නොතිබුණි.

(ඇ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුළින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි 25 දින වනවිටත් සකස්කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව සතු නව වෙළඳ සංකීර්ණය සහ බස් නැවතුම්පොල කඩකාමර 24ක් 2016 වර්ෂයේ සිට තක්සේරුකර බදුදීමට කටයුතුකර නොතිබුණි.

(ආ) වාර්ෂික දේපළ ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් දැන්වීම භාෂා 03කින් ප්‍රසිද්ධකර නොතිබුණු අතර ඒ සඳහා පුවත්පත් දැන්වීම් එලකිරීමේදී මොනරාගල දිස්ත්‍රික්කය තුල පදිංචිකරුවන්ගෙන් පමණක් මිළ ගණන් කැඳවීමෙන් සැපයුම්කරුවන් සීමාකර තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නඩත්තු හා අලුත්වැඩියා සිදුනොකිරීම

ග්‍රාමීය මාර්ග 21ක් නඩත්තු කිරීම සඳහා ග්‍රාමීය කෘෂිකාර්මික මාර්ග නඩත්තු කිරීමේ අරමුදල මගින් 2012 දෙසැම්බර් 26 දින ලැබුණු රු.500,000ක් උපයෝජනය නොකර වර්ෂ 05කට අධික කාලයක් ඉතිරි කිරීමේ ගිණුමක රඳවා තිබුණි.

### 3.3.2 පවරා නොගත් වත්කම්

සභාව විසින් භුක්ති විඳින ඉඩම් කැබලි 09ක හා සුසාන භූමි 35ක අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

### 3.3.3 නිෂ්ක්‍රීය /ඌණ උපයෝජිත වත්කම්

(අ) 2013 වර්ෂයේ සභාව විසින් රු.624,133ක් වැයකර ඉදිකර තිබුණු ඔබ්බේගොඩ නව පුස්තකාල ගොඩනැගිල්ල සහ ඒ සඳහා මිලදීගත් හා පරිත්‍යාග ලෙස ලද රු.195,695ක් වටිනා පුස්තකාල පොත් 588ක් සමාලෝචිත වර්ෂය අවසානයවන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) කසළ වෙන්කර එකතු කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව සභාව වෙත ලැබුණු රු.28,704ක් වටිනා ලීටර් 20 කසළ බඳුන් 104ක් වර්ෂ 04ක පමණ කාලයක සිට නිෂ්කාර්යව ගබඩාකර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ ආරම්භකර රු.1,071,918ක වියදමක් දරා ඉදිකරන ලද වාහන සේවා ස්ථානය හා ඒ සඳහා මිලදීගත් රු.123,325ක් වූ උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයවන විටත් භාවිතයටගෙන නොතිබුණි.

## 3.4 හඳුනාගත් අලාභ

සභාව සතු අංක ZA 3922 දරන බැකෝලෝඩර් යන්ත්‍රය අනතුරට පත්වීමෙන් සිදුව තිබූ රු.49,900ක අලාභ හානිය රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු නොකර අළුත්වැඩියා කිරීම සඳහා රු.39,900ක වියදමක් සභා අරමුදලින් දරා තිබුණි.

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.

### 3.5.2 සැපයීම් හා සේවා

ප්‍රාදේශීය සභාව විසින් පිරිවිතර සකස්කිරීමකින් තොරව මිලදී ගැනුම් සිදුකර තිබුණි.

### 3.5.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) අංක 01/2017 දරන සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රජාදායක සමිතිවලට ලබාදෙන ඉදිකිරීම් නැවත උපකොන්ත්‍රාත් ලබාදීම නොකළයුතු බව දක්වමින් කොන්ත්‍රාත් ගිවිසුම්වල කොන්දේසි ඇතුළත් කළයුතු වුවද, එසේ කටයුතුකර නොතිබුණි.

(ආ) මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තවල මාර්ගය පදම් කිරීම ඇස්තමේන්තුවල ඇතුළත්කර නොතිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තුගත ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රමාණවත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | විධිමත් පරිදි තක්සේරු නොකිරීම |
| | | (ii) | ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| (ආ) | ගිණුම්කරණය | (i) | ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | උපචිත වියදම් ගිණුම්ගත නොකිරීම |
| | | (iii) | ලැබිය යුතු ශේෂ ගිණුම්ගත නොකිරීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අයකරගෙන නොතිබීම |
| | | (ii) | බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබීම |